**වේරුගල් ප්‍රාදේශීය සභාව**
**ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය**

-------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

--------------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-------------------------------------

2018 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2019 අප්‍රේල් 05 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 16 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින සභාවේ සභාපති වෙත ඉදිරිපත් කරන ලදී.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2018 දෙසැම්බර් 31 දිනට වේරුගල් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

----------------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

--------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | රු.1,014,000 ක් වූ උසාවි දඩ මුදල් 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ආදායම් ලෙස දක්වා තිබූ නමුත් නැවතත් සමාලෝචිත වර්ෂයේදීත් එම වටිනාකමම ආදායම් ලෙස ගෙන තිබුණි. මේ නිසා සමාලෝචිත වර්ෂය සඳහා වූ ආදායම් එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | සමාලෝචිත වර්ෂයේ වැඩියෙන් පෙන්වූ වටිනාකම ගැලපිය යුතුවේ. | රු.1,014,000 ක් වූ උසාවි දඩ මුදල් මෙම වර්ෂයේ ද්වි ගණනය වී තිබුණි. මෙම වටිනාකම 2019 වර්ෂයේදී පිළියෙල කරනු ලබන අවසන් ගිණුම්වල සමුච්චිත අරමුදලට ගැලපීම් කරනු ලබන බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ මිලදී ගනු ලැබූ රු.200,134 ක් වටිනා වාහන ටයර් මූලධන වියදම් ලෙස දැක්වීමෙන් ස්ථාවර වත්කම්වල වටිනාකම එම වටිනාකමින් වැඩියෙන් ද පුනරාවර්තන වියදම් එම වටිනාකමින් අඩුවෙන්ද දක්වා තිබුණි. | දෝෂ සහගතව වර්ගීකරණය කර ඇති විෂයයන් ගැලපීමට කටයුතු කළ යුතු අතර ඉදිරියේදී නිවැරදිව වර්ගීකරණය කළ යුතු වේ. | සමාලෝචිත වර්ෂයේ මිලදී ගත් රු.200,134 ක වාහන ටයර් මිලදී ගැනීම මෙම වර්ෂයේදී මූලධන වියදම් ලෙස දක්වා ඇත. මෙම වටිනාකම ඉදිරි මූල්‍ය ප්‍රකාශනවලින් අදාළ ගිණුම්වල ගැලපීම් කරනු ලැබේ. |

### 1.3.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එකතුව රු.47,954 ක්වූ විවිධ ණයහිමි ශේෂ හතරක් නිරවුල් නොකර පසුගිය වසර 10 ක් පුරා දිගින් දිගට ඉදිරියට ගෙනවිත් තිබුණි. | තොරතුරු රැස්කර අදාළ ක්‍රියාමාර්ග ගත යුතු වේ. | එකතුව රු.47,954 ක විවිධ ණයහිමියන් 04 දෙනෙකුගේ හිඟ ශේෂ සම්බන්ධයෙන් නිවැරදි ලිපිලේඛන නොමැති වීමෙන් මෙය ඉදිරියේදී ආදායමට මාරු කිරීමට කටයුතු කරන බව දන්වමි. |

### 1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

| ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| | රු. | | | |
| අත්තිකාරම් ලැබීම් | 326,780 | විස්තරාත්මක ලැයිස්තු | සාක්ෂි ලේඛන සභාව සතුව නොමැති බව තහවුරු කර වැඩිදුර ක්‍රියාමාර්ග ගත යුතු වේ. | මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර තිබූ නමුත් මේ සම්බන්ධයෙන් සාක්ෂි ලේඛන අප සභාවේ නොමැත. මේ නිසා මේ සම්බන්ධයෙන් වැඩිදුර ක්‍රියාමාර්ග ගනු ලබන බව කාරුණිකව දන්වමි. |
| අනෙකුත් ආයෝජන | 233,820 | | | |

### 1.4 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 193 | | | |
| | අයවැයගත සහ තථ්‍ය වියදම් අතර නිරීක්ෂණය වූ විචලතා පිළිබඳ පැහැදිලි කිරීමේ ප්‍රකාශයක් පිළියෙල කර විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | විචලනයන් සඳහා පැහැදිලි කිරීම් අඩංගු ප්‍රකාශය පිළියෙල කර විගණනයට ඉදිරිපත් කළ යුතු වේ. | වර්ෂය සඳහා තථ්‍ය ආදායම් හා වියදම් පිළිබඳ අයවැය සමඟ සසඳා විචලනයන් සඳහා ඇමුණුම් ඉදිරි මූල්‍ය ප්‍රකාශවල හෙළිදරව් කෙරේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 571 මුදල් රෙගුලාසිය | වර්ෂ 2 කට වැඩි, රු.375,155 ක් වූ ටෙන්ඩර් තැන්පතු, විවිධ තැන්පතු, රඳවුම් මුදල් සහ අනෙකුත් තැන්පතු නිරවුල් කිරීමට හෝ ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | රු.375,155 ක් වටිනා තැන්පතු සම්බන්ධයෙන් අදාළ ලේඛන පරීක්ෂා කොට සුදුසු ඒවා ආපසු ලබාදීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |
| (ඇ) | | සියලුම අත්තිකාරම් දින 10 ක් තුළ නිරවුල් කළ යුතු බව සඳහන් වුවද වර්ෂ 01 සිට වර්ෂ 11 කාලයක් තිස්සේ පවතින රු.1,325,799 ක් වූ අත්තිකාරම් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | රු.1,325,706 ක් වටිනා අත්තිකාරම්වලින් රු.709,491 ක අත්තිකාරම් 2018 වර්ෂය සඳහා වේ. ඉන් බහුතරයක් නිරවුල් කර ඇත. රු.6,162,014 ක් වටිනා අත්තිකාරම් පසුගිය වර්ෂ 05 කට අධික කාලයක සිට පැවත එන ඒවාය. මෙය නිරවුල් කිරීම සම්බන්ධයෙන් කටයුතු කරනු ලැබේ. |

## 2. මූල්‍ය සමාලෝචනය
-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල
----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,344,198 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.4,074,709 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය
------------------------

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්
------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා වූ ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුගත ආදායම, බිල්කළ ආදායම, රැස්කළ ආදායම හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| (i) කුලී | 1,684 | 922 | 1,253 | 505 | 609 | 1,130 | 1,157 | 632 |
| (ii)වෙනත් ආදායම් | 3,990 | 1,849 | 2,863 | 256 | 3,513 | 160 | 2,899 | 1,279 |

### 2.2.2 කුලී ආදායම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | සභා කඩ පේලියේ අංක D දරන කඩය 2018 පෙබරවාරි 01 දින සිට කුලියට ලබා දී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (අ) | මෙම කඩ කාමරය සඳහා හිඟ කුලී රු.79,200 ක් සහ දඩ ගාස්තු රු.7,920 ක් වශයෙන් එකතුව රු.87,120 ක් වුවද, මෙම වටිනාකම විගණන දිනය වන 2019 මැයි 14 දින වන විටත් අයකර ගෙන නොතිබුණි. | හිඟ කුලී අයකිරීමට කටයුතු කල යුතු වේ. එසේම, ඉදිරි කාලයේදී හිඟ කුලී ඇති නොවන අයුරින් ඒ ඒ අවස්ථාවේදී සභාව කටයුතු කළ යුතු වේ. | රු.87,120 ක්වූ මුදල්, කොටස් වශයෙන් මාස 03 ක් ඇතුළත ගෙවන ලෙස අදාළ කුලීකරුට දන්වා ඇත. ගෙවීම් පැහැර හැරීමේදී නීතිමය ක්‍රියාමාර්ග ගන්නා අතර, අදාළ මුදල් අයකරනු ලබන බව දැනුම් දෙමි. |
| (ආ) | කඩ කාමරය ලබාගත් අයගේ ගිවිසුම් අවසන් දිනය 2023 පෙබරවාරි 01 වුවත්, 2018 නොවැම්බර් මාසයේදී ගිවිසුම් අත්හිටුවා තිබුණි. ගිවිසුම් (ඇ) වගන්තිය ප්‍රකාරව ගිවිසුම් කාලය ඇතුලත ගිවිසුම අවසන් වුවහොත් ආරක්ෂිත ඇප ආපසු නොගෙවා ආදායමට මාරු කළ යුතුය. එසේ වුවත්, රු.144,000 ක් වූ ආරක්ෂිත ඇප ආදායමට මාරු කර නොතිබුණි. | ගිවිසුමේ (ඇ) වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | අදාළ කඩ කාමරය සම්බන්ධයෙන් ඔබගේ නිර්දේශ අනුගමනය කිරීමට ක්‍රියාමාර්ග ගන්නා බව දැනුම් දෙමි. |

### 2.2.3 උසාවි දඩ මුදල් හා මුද්දර ගාස්තු

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | **උසාවි දඩ මුදල්** | | |
| | සමාලෝචිත වර්ෂයේ මැයි මාසයේ සිට දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදයට අදාළ උසාවි දඩ | අදාළ කාලය සඳහා උසාවි දඩ මුදල් ගණනය කර අයකළ යුතු වේ. එසේම, | සමාලෝචිත වර්ෂයේ මැයි සිට දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදයට අදාළ උසාවි දඩ මුදල් ලබා ගැනීම |

| | | |
|---|---|---|
| මුදල් ගණනය කර අයකිරීමට කටයුතු කර නොතිබුණි. | අයකිරීම්වල සිදුවන කාල ප්‍රමාදය අවම කිරීමට කටයුතු කළ යුතු වේ. | පිළිබඳව අදාළ දෙපාර්තමේන්තුවට සිහි කැඳවීම් සිදුකර ඇත. |

(ආ) මුද්දර ගාස්තු
---------------

| | | |
|---|---|---|
| 2016, 2017 සහ 2018 වර්ෂ සඳහා වූ මුද්දර ගාස්තු ගණනය කර රෙජිස්ට්‍රාර් ජනරාල් වෙතින් අයකර ගැනීම සඳහා නිසි පරිදි කටයුතු කර නොතිබුණි. | අදාළ කාලයන් සඳහා මුද්දර ගාස්තු ගණනය කර අයකළ යුතුය. එසේම, අයකිරීම්වල සිදුවන කාල ප්‍රමාදයන් අවම කිරීමේ කටයුතු කළ යුතු වේ. | 2016, 2017, 2018 වර්ෂ සඳහා මුද්දර ගාස්තු ගණනය කර ලබාගැනීමට අවශ්‍ය කටයුතු දැන් සිදුකර ඇත. |

**3. මෙහෙයුම් සමාලෝචනය**
**----------------------------**

**3.1 කාර්යසාධනය**
**-------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) තිරසාර සංවර්ධන ඉලක්ක**
**----------------------------**

| **විගණන නිරීක්ෂණ** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රටවල රාජ්‍ය නායකයින්ගේ නායකත්වයෙන් 2015 වර්ෂයේ තිරසර සංවර්ධන සම්මේලනයේ තීරණය අනුව සභාව විසින් 2030 වර්ෂයේ ලභාකරගත යුතු තිරසාර සංවර්ධන වැඩසටහන් න්‍යාය පත්‍රය සම්බන්ධයෙන් මැනීම සඳහා දර්ශකයන් ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි. | සභාව මෙම කාරණාව සම්බන්ධයෙන් තිරසාර සංවර්ධන ඉලක්ක සකස් කර මෙහෙයුම් ආරම්භ කිරීමට කටයුතු කළ යුතු වේ. | 2018 වර්ෂයේ තිරසාර සංවර්ධනය පිළිබඳ කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. එසේ වුවත්, ඉදිරි වර්ෂයේදී අදාළ චක්‍රලේඛ විධිවිධාන අනුව තිරසාර සංවර්ධන ඉලක්ක සකස් කර ඒ අනුව සුදුසු ක්‍රියාමාර්ග ගනු ලබන බව දන්වමි. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සභා බල ප්‍රදේශයට අයත් ප්‍රදේශවල ඉපදුනු ළදරුවන්ගෙන් බර අඩු ළදරුවන්ගේ අනුපාතය 2015, 2016, 2017 සහ 2018 වර්ෂවලදී පිළිවෙලින් සියයට 40, 50 හා 55 ක් වූ අතර 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා අයවැය ඇස්තමේන්තුවේ මාතෘ ළදරු සුභසාධනය හා ළමා ආරක්ෂාව සඳහා කිසිඳු ආකාරයක ප්‍රතිපාදන වෙන්කිරීමක් සිදුකර නොතිබුණි. මේ නිසා, සභාව විසින් මාතෘ ළදරු සුභසාධනය කෙරෙහි සැලකිල්ලක් දක්වා නොතිබුණි. | මෙම කරුණ පිළිබඳව සභාව සැලකිල්ල යොමු කළ යුතු වේ. | මේ සම්බන්ධයෙන් 2019 අයවැය ඇස්තමේන්තුවෙන් ප්‍රතිපාදන වෙන්කර ඇත. මේ අනුව මාතෘ ළදරු පෝෂ්‍යදායි ආහාර සැලැස්මක් (කොළ කැඳ) ක්‍රියාත්මක කිරීමට තීරණය කර ඇත. |
| (ii) | රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ 2013 අප්‍රේල් 22 දිනැති අංක ඊඑස්ටී - 8/යුඑන්අයිඑෆ්/ඕ/06/0302/6 චක්‍රලේඛයේ 2(අ) ඡේදය ප්‍රකාරව සහ XXI පරිච්ඡේදය ප්‍රකාරවත් ලබාදී තිබූ නිල ඇඳුම් රෙදි සහ මැහුම් ගාස්තු වෙනුවට රියදුරන්ට සහ කාර්යාල කාර්යය සහයකයන්ට 2013 ජනවාරි 01 පටන් ක්‍රියාත්මක වන පරිදි වර්ෂයකට රු.4,000 ක මුදලක් ගෙවිය යුතු වේ. එනමුත් නිල ඇඳුම් සඳහා සමාලෝචිත වර්ෂයේ සභාවේ සිටින සේවකයන් 27 දෙනාගෙන් 06 දෙනෙකුට පමණක් මෙම ගෙවීම සිදුකර තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව සේවකයින්ට අදාළ දීමනා වාර්ෂිකව ලබාදීමට කටයුතු කළ යුතු වේ. | නිල ඇඳුම් දීමනා ලබාදීම පිළිබඳව 2018 මැයි අයවැය ඇස්තමේන්තුවේ ප්‍රමාණවත් ප්‍රතිපාදන සලසා නොතිබුණි. මේ හේතුව නිසා 06 දෙනෙකුට පමණක් ලබා දී ඇත. 2019 වර්ෂයේ ප්‍රමාණවත් ප්‍රතිපාදන සලසා ඇත. එම නිසා, සභාවේ මූල්‍ය තත්ත්වයට අනුකූලව සියළුම සේවකයන්ට ලබාදෙනු ලැබේ. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ සෞඛ්‍ය සේවා කම්කරු පුරප්පාඩුව පිරවීමට ආණ්ඩුකාරවරයාගේ ලේකම් විසින් 2018 ජුලි 25 දින ස්ථිර පත්වීම් ලබා දී තිබුණි. එසේ වුවත්, සභාවේ සභාපතිවරයා විසින් එම සේවකයාගේ රාජකාරි භාරගැනීම ප්‍රතික්ෂේප කර ඇත. මේ සම්බන්ධයෙන් සභාව කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | අදාල සේවකයාට රාජකාරි භාර ගැනීමට කටයුතු සිදු කල යුතු වේ. බඳවා ගැනීම් පරිපාටීන්ගෙන් බැහැරවීම් විධිමත් කළ යුතු වේ. | 2018 ජුලි 25 පත්වීම් සම්බන්ධයෙන් බඳවාගැනීම් පරිපාටිය අනුව ඒ වන විටත් අදාළ පුරප්පාඩුව සඳහා දීර්ඝ කාලයක සිට එක් කම්කරුවෙක් රාජකාරි කරමින් පැවති අතර එම සේවකයා රාජකාරි භාරගැනීම ප්‍රතික්ෂේප කර ඇත. |

## 3.4 වත්කම් කළමනාකරණය

### 3.4.1 වත්කම් ලියාපදිංචි නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වෙනත් ආයතන විසින් පරිත්‍යාග කරනු ලැබූ වාහන 07 ක් වර්ෂ 08 ක් තිස්සේ භාවිතා කරමින් පැවතියද ඒවායේ අයිතිය සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පැවරීමට කටයුතු කළ යුතු වේ. | අනෙකුත් ආයතනවලින් ලබාගත් වත්කම් සභාවේ නමට කඩිනමින් මාරුකිරීමට කටයුතු කරනු ලැබේ. |

### 3.4.2 නිෂ්කාර්ය වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාවට අයත් කාමර 07 කින් සමන්විත රු.2,272,800 ක් වටිනා කඩ කාමර පේළියක් 2011 වසරේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අක්‍රීයව පැවතිණි. | නිෂ්කාර්යව පවතින කඩ පේළිය භාවිතා කිරීමට කටයුතු කළ යුතු වේ. | රු. 2,272,800ක් වටිනා කඩකාමර පේළිය සභාවේ පැරණි භාණ්ඩ අගුල් දමා ඇති ගබඩාව ගෙසට භාවිතා කරයි. ඉදිරියේදි මේවා කුලියට දීමට කටයුතු කරනු ලබන බව කාරුණිකව දන්වමි |

| | | | |
|---|---|---|---|
| (ආ) | සීසෑමේ යන්ත්‍රයක්, ද්වි රෝද සීසෑමේ යන්ත්‍රයක්, රෝඩ් රෝලර් සහ ත්‍රී රෝද රථයක් වසර 04 ක් පුරා අක්‍රියව පැවතිණි. ඒවා අලුත්වැඩියා කිරීමට හෝ වෙන්දේසියේ විකිණීමට කටයුතු කර නොතිබුණි. | අලුත්වැඩියා කර භාවිතා කිරීමට හෝ වෙන්දේසියේ විකිණීමට කටයුතු කළ යුතු වේ. | මෙයින් ත්‍රිරෝද රථය සහ රෝලර් අලුත්වැඩියාව සම්බන්ධයෙන් සභාවේ මූල්‍ය තත්ත්වය මත කටයුතු කරනු ලැබේ. නැතහොත් ඔබගේ නිර්දේශ අනුව කටයුතු කරනු ලැබේ. |

**3.4.3 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේදී සභාව විසින් පවත්වාගෙන යන පුස්තකාලයේ පොත් 143 ක් අතුරුදහන් වීම මණ්ඩලය විසින් පෙන්වාදී තිබුණි. මේ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | සමීක්ෂණ නිලධාරියා විසින් සඳහන් කළ කරුණ වහාම ක්‍රියාත්මක කළ යුතු වේ. | සඳහන් කළ පොත් 143 ක ඌනතාවය පිළිබඳව පුස්තකාලයේ සේවය කරන සේවකයාගෙන් විමසීම් කර ඇත. අදාළ පොත්වල වටිනාකමට අනුව එම සේවකයාගෙන් අයකිරීමට කටයුතු කර ඇත. |

**3.5 ප්‍රසම්පාදනය**

**3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ 2006 මාර්තු 24 දිනැති අංක 128 චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා සභාව ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | සභාව විසින් වාර්ෂිකව ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කළ යුතු වේ. | 2018 වර්ෂයේ සභාව සඳහා වූ ප්‍රසම්පාදන සැලැස්ම අංගසම්පූර්ණව පිළියෙල කර නොතිබුණි. එසේ වුවත්, 2019 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර ඇති බව දන්වා සිටිමි. |

### 3.5.2 කොන්ත්‍රාත් පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **(අ)** | **සූර්ය බලශක්තිය** | | |
| (i) | 2014 ජුලි 04 දිනැති අංක 28 දරන ප්‍රසම්පාදන පරිපාටි (අතිරේක) ප්‍රකාරව රු.2,000,000 දක්වා පමණක් සභාවට ප්‍රසම්පාදන සිදුකළ හැක. එනමුත් මෙම කටයුත්ත සඳහා මිල ගැණුම් පරිපාටි උල්ලංඝනය කරමින් සිදු කර තිබුණි. එනිසා ප්‍රසම්පාදන පරිපාටියේ 1.2.1(II) මගින් අපේක්‍ෂිත අරමුණු සාක්‍ෂාත් කර ගෙන නොතිබුණි. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදුකිරීමේදී අනිවාර්යයයෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කළ යුතු වේ. | සූර්ය බලශක්ති විදුලි පහන් අලුත්වැඩියා සඳහා ප්‍රතිපාදන ප්‍රාදේශිය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන මගින් අප වෙත ඔක්තෝබර් මාසයේදී ලැබී තිබුණි. එම ප්‍රතිපාදනයෙන් අදාල වැඩසටහන 30/11/2017 දන ඇතුලත නිම කර අමාත්‍යාංශයට එදින ඇතුළත වියදම් ගෙවීම් වවුචරය ඉදිරිපත් කළ යුතු බව දන්වා ඇත. ඒ අනුව, අදාල කාර්යය නිම කර පළාත් පාලන කොමසාරිස්වරයා මාර්ගයෙන් යැවීම සඳහා කාල සීමාව හිඟවීම නිසාත් එය පුවත් පත්දැන්වීම් පල කර ප්‍රචාරණ ගාස්තු ගෙවීම සඳහා ප්‍රතිපාදන නොමැතිවීම නිසාත්, ඒ වනවිටත් සවිකර තිබූ සූර්ය බලශක්ති විදුලි පහන් නිසියාකාරයෙන් නොදැල්වීම නිසා ඒවා වහාම අලුත්වැඩියා කිරීමට මහජනයා විසින් වරින් වර පැමිණිලි කිරීම නිසාත්, මිලදි ගැනීමේ පදනම මත අලුත්වැඩිය කිරීමට සිදු වී ඇත. |
| (ii) | අලුත්වැඩියාවෙන් පසු දිගින් දිගට නඩත්තුව සඳහා වූ වගන්තියක් මෙම කොන්ත්‍රාත්තු සඳහා වූ ගිවිසුමට ඇතුළත්කර නොතිබුණි. එනිසා අලුත්වැඩියා අවස්ථාවක් සිදුවන විට අතිරේක ගෙවීම් දැරීමට සිදුවිය හැකිය. | නඩත්තු ගිවිසුම් සඳහා එළඹීමේදී එය අපට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වේ. | ගිවිසුම් ආයතනය සමඟ නඩත්තු සඳහා ගිවිසුම් අත්සන් කර තිබුණත් සැලැස්මේ වූ තිරසාරභාවය සැලකිල්ලට ගනිමින් වෙනත් ආකාරයේ නඩත්තු ගිවිසුමක් හෝ සුදුසු වෙනත් ක්‍රියාමාර්ගයක් ගැනීමට අවධානය යොමුකර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. |
| (iii) | අලුත්වැඩියා කළ විදුලි පහන් 65 ක බැටරි ගලවා 2019 මාර්තු මාසයේ පරීක්ෂා කිරීමේදි බැටරි | සියළුම විදුලි පහන් ක්‍රියාකර වීමට කටයුතු කළ යුතු වේ. | අලුත්වැඩියා කළ විදුලි පහන් 65 න් ඇතැම් ඒවා දැල්වෙන කාලය අඩු බැවින් ඒවායේ බැටරි ගලවා |

| | | | |
|---|---|---|---|
| | 33ක් පරීක්ෂණ වාර්තා ප්‍රමිතියට වඩා අඩුව් තිබුණි. මේ සම්බන්ධයෙන් සභාව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | | බැටරියේ ක්‍රියාකාරීත්වය පරීක්ෂා කර ඇත. මේ අනුව බැටරියේ වගකීම් කාලය පවතින නිසා අදාළ ගැටළුව පිළිබඳ ගිවිසුම්කරුට දැනුම් දී ඇත. ගිවිසුම්කරුගේ ඇප මුදල් අප සතුව ඇත. අදාළ කරුණු සැලකිල්ලට ගෙන කටයුතු කරන බව දන්වා සිටිමි. |
| (ආ) | **ශ්‍රවනාගාරය ඉදිකිරීම**<br>-------------------------- | | |
| | පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය විසින් ප්‍රාදේශීය සභා සවිබල ගැන්වීම සඳහා සලසන ලද ප්‍රතිපාදන යටතේ ශ්‍රවනාගාරයක් ඉදිකිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව 2017 නොවැම්බර් 17 දින රු.749,486 ක මුදලකට පිරිනමා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ සිදු කෙරේ. | ප්‍රසම්පාදන ආයතනය තම සභාව වූ බැවින් පැහැදිලි කිරීම් විගණනය ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වේ. | (අ), (ආ), (ඇ), (ඈ), (ඉ) හා (ඊ) රු.මිලියන 05 කට වැඩි නිසා ඉහත ලංසු ක්‍රියාවලිය පළාත් පාලන කොමසාරිස් කාර්යාලය මාර්ගයෙන් සිදුකළ අතර මේ සඳහා තාක්ෂණික ඇගයීම් කාර්යයන් ඉහත සඳහන් ආයතනය මාර්ගයෙන් සිදු විය. |
| (i) | ප්‍රසම්පාදන පරිපාටියේ 3.3 ඡේදය ප්‍රකාරව කොන්ත්‍රාත්කරුවන් සංඛ්‍යාව ස්වල්ප බැව් පෙනීගිය අවස්ථාවක සීමිත තරඟකාරී මිල ගණන් (LNCB) කැඳවිය හැක. එසේවුවත්, වැඩි කොන්ත්‍රාත්කරුවන් සංඛ්‍යාවක් සිටියදීත්, ජාතික මට්ටමේ තරඟකාරී මිලගණන් (NCB) කැඳවීම වෙනුවට සීමිත තරඟකාරී මිලගණන් කැඳවීම සිදුකර තිබුණි. එනිසා ප්‍රසම්පාදන පරිපාටියේ 1.2.1 (ඇ) මගින් අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කරගෙන නොතිබුණි. | | |
| (ii) | කොන්ත්‍රාත්කරු විසින් සිදුකළ අවශ්‍ය ගණනය කිරීම් දෝෂ නිවැරදි කිරීමෙන් පසු කොන්ත්‍රාත්තු මිල රු.7,248,750 ක් විය. එනමුත් මෙම සංශෝධිත මිල සැලකිල්ලට නොගෙන සභාව විසින් රු.6,749,486 ටම කොන්ත්‍රාත් පිරිනමා තිබුණි. | | |

(iii) කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කළ මිල ගණන ඇස්තමේන්තුගත මිලට වඩා රු.1,793,814 කින් අඩු විය. එනිසා ප්‍රසම්පාදන පරිපාටියේ 7.9.11 ප්‍රකාරව කළ යුතු නොකර කොන්ත්‍රාත් පිරිනැමීම තාක්‍ෂණික ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කර තිබුණි.

(iv) කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කළ මිල ගණන ඇස්තමේන්තුවේ සඳහන් ගණන රු.2,406,590 කින් ඉක්මවා තිබුණි. එනමුත් තාක්ෂණික ඇගයීම් කමිටුව කොන්ත්‍රාත්තුව පිරිනැමීම නිර්දේශ කර තිබුණි.

(v) විගණනය සිදු කළ 2018 මාර්තු 23 දින වන විටත් රු.785,000 කට ඇස්තමේන්තු කළ වැඩ මුළුමනින්නම සිදු කර නොතිබුණි. එනමුත් පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයෙන් අග්‍රිම ලබා ගැනීම පිණිස කාර්යය ඉටුකර ඇති බවට අදාල වගකිව යුතු කාර්මික නිලධාරීයා විසින් සහතික කර අමාත්‍යාංශයට යවා තිබුණි.

(vi) 2018 ජනවාරි 12 දින වන විට කොන්ත්‍රාත්කරු විසින් වැඩ නිමකර භාරදීය යුතුව තිබුණි. එනමුත්, විගණන දිනය වූ 2019 මැයි 14 දිනටත් කර්මාන්තයෙන් සියයට 76 ක් නිම කර නොතිබුණි. තවද, රු.674,948 ක්වූ ප්‍රමාද ගාස්තු කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගැනීමටද කටයුතු කර නොතිබුණි.